**ශීර්ෂය 194 - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 නොවැම්බර් 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝම්බර් 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශ |
|---|---|---|
| 1.6.1.2 | සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශයේ පොත් අනුව නිලධාරීන්ට ණය ශේෂ එකතුව හා අත්තිකාරම් පාලන ගිණුම අනුව ණය ශේෂය රු. 96,404,732 ක් වූ අතර එය භාණ්ඩාගාර පොත් අනුව රු.96,580,230 ක් වූයෙන් අමාත්‍යාංශය හා භාණ්ඩාගාර පොත් අනුව රු.175,498 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නිවැරදි කිරීමට ක්‍රියාකළ යුතුය. |
| 1.6.1.3 | වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.10,849,275 ක් වූ හා වර්ෂ 05 ඉක්මවූ එකතුව රු.6,365,092 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අමාත්‍යාංශයට අයත් අංශ දෙකක් වන නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ සිට හම්බන්තොට කුඩා ව්‍යාපාර අංශය වෙත 2020 ජුනි 09 දින ස්ථාන මාරුවී තිබුණු නිලධාරින් | අදාළ අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී නිවරදි කිරීමට කටයුතු කරණු ලැබේ. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුුතු වීම. |

දෙදෙනෙකුගේ එකතුව රු.109,900 ක් වූ ආපදා ණය ශේෂ අත්තිකාරම් ගිණුමේ සේවයේ නියුතු නිලධාරින්ගෙන් අයවිය යුතු කේවල ණය ශේෂ ලැයිස්තුවේ සහ ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගේ ණය ශේෂය යටතේ දැක්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගිණුමේ අයවිය යුතු ණය ශේෂය වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| අංක 250/ 2016(i) හා 03 අගෝස්තු මස 2016 දිනැතිරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය පරිදි අත්තිකාරම් ගෙවීමේදී එක් එක් අත්තිකාරම් වෙනුවෙන් කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් යටතේ වෙනම ගිණුම් අංකයක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු බව දන්වා තිබුණදඝතිව්‍යා ,යක් සඳහා ලබාදී තිබුණු රු.16,633,062 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුම්ගතකර නොතිබුණු අතර අත්තිකාරම් මුදලින් 2020 .දිනට අයවිය යුතු රු 31 දෙසැම්බර්15,503,089 ක වටිනාකමද ගිණුමේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | වෙනමම ගිණුම් අංක ලබාගෙන අත්තිකාරම් ගිණුම්ගත කර නොමැත. ඉදිරියේදී මෙම අඩුපාඩු සිදු නොවන පරිදි කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අත්තිකාරම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනය රු.2,464,242,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් උපයෝජනය කර තිබුණේ රු.1,506,877,006 ක් පමණි. ඒ අනුව ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් රු.957,364,994 ක් හෙවත් සියයට 39 ක් ඉතිරි වී තිබුණි. | රට තුළ නිරෝධානය ඇදිරි නීතිය පැනවීම හා සංචරණ සීමා පැනවීම හේතුවෙන් මූලධන ව්‍යාපෘති නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | කාර්යභාරය ඉටු කිරීම ආරම්භවන කාලවකවානු නිශ්චය කර වර්ෂයේදී ඉටුකළ හැකි කාර්ය ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතු වීම |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/ හි 2020 10. ඡේදය 1යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ අංක 06 3 හි. ඡේදය අනුව සටහන් අංක 4(iii) යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමග සැසඳී තිබිය යුතු වුවද සටහන අංක iii යටතේ වූ බැදිම් හා බැරකම් ප්‍රකාශය හා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලැබූ බැදීම් හා බැරකම් ප්‍රකාශය අතර වැය විෂයයන් කට අදාලව 65 .රු732,021,009 ක් වැඩියෙන් හා රු.128,709,510 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කර ගැනීමට කටයුතු යොදා ඇත. | බැරකම් හා බැදීම් පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛවල විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/ හි 2020 10.කාශන ප්‍රඡේදය යටතේ මූල්‍ය 1 පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ අංක 06 3 හි. ඡේදය අනුව සටහන් අංක 4(iii) යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ වාර්තා නොකල කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස වර්ෂයේ නිරවුල් නොකලයුතු බව 2021 2020 නමුත් .දක්වා තිබුණිවර්ෂයේ වියදම් ලෙස වාර්තා කර නොතිබුණු රු . 368,912 ක් වර්ෂයේ ගෙවා තිබු 2021ණි. | බිල්පත් ප්‍රමාද වී ලැබීම හා දෙසැම්බර් අතිකාල ප්‍රමාද වී ඉදිරිපත් වීම හේතුවෙන් නිශ්චිතවම දෙසැම්බර් 31 දින වන විට ඇස්තමේන්තු කිරීම අසීරු විය. | බැරකම් හා බැදීම් පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛවල විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට වූ අත්තිකාරම් "බී" ගිණුම අනුව අයවීම් හිඟහිට තිබුණු නිලධාරීන් 08 දෙනෙකුගේ ශේෂවල එකතුව රු.916,296 ක් වූ අතර, ඉන් වර්ෂ 01 ට අඩු ශේෂවල එකතුව රු.495,704 ක් හා වර්ෂ 01 හා 02 අතර ශේෂවල එකතුව රු.420,592 ක් විය. | අයකර ගැනීමට කටයුතු යොදා ඇත. | අයවීම්, හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2018 වර්ෂයේ සිට අයවිය යුතු රු.336,480 ක ණය ශේෂ විගණන දින (2021 අප්‍රේල් 01) වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ණය අයකර නොගැනීම නිසා රු.44,751 ක පොලී මුදලක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය. | අයකර ගැනීමට කටයුතු යොදා ඇත. | නිලධාරීන්ගේ ණය ශේෂ නිවැරදිව අයකර ගත යුතු වීම. |

## 2.4 තැන්පත් ශේෂයන්

----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 2 සිට 5 දක්වා පැරණි තැන්පතු 34 ක එකතුව රු.16,183,793 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ඉදිරියේදී නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ගිණුම් අංක 7040742**<br>නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස ක් ඉක්ම 06 වූ එකතුව රු.214,718 ක් වටිනා චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් මු .රෙ.396 (ඇ) ප්‍රකාරව ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි **396 (ඇ)** ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **නුවරඑළිය ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම**<br>මුහුදු මට්ටමේ සිට මීටර් 1895 ක උසින් පිහිටා ඇති නුවරඑළිය නගරයේ ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5 ක් වන ඉඩමක ක්‍රීඩා පුහුණුවීම් ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දරා ගැනීම් හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් ඉදිකිරීමට යෝජිත උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතිය වසර 03 ක් තුළ සිදු කිරීමටත් එහි කොන්ත්‍රාත් වටිනාකම යුරෝ 75,528,700 ක් වූ පිරිවැයෙන් සියයට 70 ක් එක්සත් රාජධානියේ අපනයන මූල්‍ය ආයතනය මගින්ද ඉතිරි සියයට 30 මහජන බැංකු මගින්ද සපයා ගැනීම සඳහා ණය ගිවිසුම් අත්සන් කර ණය සැලසුම් ගාස්තු ලෙස යුරෝ 264,492.34 ක් එනම් රු.51,047,021 ක් ණය පහසුකම් සපයනු ලබන බැංකුව වෙත ගෙවා තිබුණි. 2019 | මෙම ව්‍යාපෘතිය මේ අවස්ථාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයට ප්‍රමුඛ ව්‍යාපෘතියක් නොවන බව මෙම අමාත්‍යාංශය හඳුනාගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවලංගු කිරීම සුදුසු බව අමාත්‍යාංශය නිරීක්ෂණය කර අංක MOYS/PLN/05/04 සහ 2021.02.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන ලදී. එම අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව අංක අමප/21/0242/329/001 සහ 2021/02/22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නුවරඑළිය ඉහළ උන්නතාංශ | ක්‍රීඩකයින් ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමට අදාළ පුහුණුවීම් කටයුතු සිදු කිරීම සඳහා යටිතල පහසුකම් සැලසීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගත යුතු වීම සහ ව්‍යාපෘති අප්‍රමාදව ක්‍රියාත්මක කර නියමිත කාල වකවානුවල නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| වර්ෂය තුළ මුළු වියදම රු.53,551,631 ක් වූ අතර 2019 වර්ෂයේ මුල් කාර්තුවේදී මෙම ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කිරීමට අපේක්ෂා කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී නවතා දැමීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වැය කළ මුළු වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. | ක්‍රීඩා පුහුණු සංකීර්ණය ඉදිකිරීම සඳහා අදාළ ආයතනය සමග එළඹ ඇති කොන්ත්‍රාත් ගිවිසුම සහ මොරටුව විශ්වවිද්‍යාලය සමඟ එළඹි උපදේශන ගිවිසුම අවලංගු කිරීමටත්, මහජන බැංකුව සමඟ එළඹි ණය ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කර එම ගිවිසුම් ගත ණය මුදල සුදුසු වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට හෝ අවලංගු කිරීමටත්, මෙම ණය ගිවිසුම සහ කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීමෙන් සිදුවන සේවා ගාස්තු (ණය සැකසුම් ගාස්තු ද ඇතුළත්ව) අත්හැරීම සඳහාත් මහා භාණ්ඩාගාරයේ ලේකම්ට බලය පැවරීම සහ අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට අනුමැතිය ලැබී ඇත. වෙළඳ හා උපදේශන ගිවිසුම්ද අවලංගු කර ඇත. | |

## 3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතනයන් වෙත එකතුව රු.153,345,000 ක් වටිනා වාහන 15 ක් ලබාදී තිබුණු අතර එම වාහන භාවිතා කරනු ලබන පාර්ශවයන් වෙත පවරා දී නොමැති බව නිරීක්ෂණය විය. | වාහන 13 ක් පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. වාහන 02 ක් තාවකාලික පදනමින් පවරා දී ඇති අතර එම වාහන පවරා දීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අදාළ වාහන අප්‍රමාදව පවරා දීමට කටයුතු කර වත්කම් කළමනාකරණය නියමිත පරිදි සිදු කළ යුතු වීම. |
| (ආ) අමාත්‍යාංශය විසින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් රු.9,100,000 ක් වටිනා මෝටර් වාහනයක් භාවිතා කරනු ලබන අතර එම වාහනය අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | වාහනයේ ලියාපදිංචි සහතිකය බැංකුව මඟින් නිදහස් කර අමාත්‍යාංශය වෙත ලබා නොදීම නිසා පවරා ගැනීම කල් ගත වී ඇත. | බාහිර ආයතන වෙතින් ලබාගත් වත්කම් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි ,කාරව රජයේ මුදල්හි විධිවිධාන ප්‍ර 880 ආදායම් මුද්දර හෝ බඩුබාහිරාදිය භාර ගැනීම හෝ භාරව එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ ,සිටීම මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්දසහතික කරන ,රජයේ ගිණුමට අදාළ වවුචර , චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු වැනි අධිකාරිය වන රජයේ 612 අවංකව ඉටු කරන බවට ඥා පනතට අනුකූලව ඇප තැබිය නිලධාරීන්ගේ ඇප ආ යුතු වුවදතනතුරු 21 කට අදාළව ඇප තැබීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඇප තැබීම සම්බන්ධ සියලු කටයුතු අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඇප තැබිය යුතු නිලධාරින් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය හා ඊට ඇතුළත් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට ඉලක්ක ස්ථාපිත කර තිබුණි. ක්‍රීඩා අමාත්‍යාංශයේ හඳුනාගත් ජයග්‍රහන දර්ශක 02 ක ප්‍රගතිය පිළිවෙලින් සියයට 59 ක් හා සියයට 50 ක් විය. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ස්ථාපිත කර තිබුණු ජයග්‍රහන දර්ශක 02 හි ප්‍රගතිය පිළිවෙලින් සියයට 57.9 ක් හා සියයට 63.8 ක් විය. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණු අතර, ජයග්‍රහන දර්ශක 3 ක් පමණක් හඳුනාගෙන තිබුණි. එහි ප්‍රගතිය සියයට 60 සිට සියයට 70 දක්වා පරාසයක පැවතුණි. | **Covid -19** වසංගත තත්ත්වය යටතේ සැලසුම් කල පරිදි කරගෙන යාමට බාධා ඇති වීම, කොන්ත්‍රාත් උපදේශන ආයතන ගැටළු හා ආනයන සීමා කිරීම මගින් පැන නඟින ගැටළු ප්‍රගතිය අඩුවීමට හේතු විය. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමට අවශ්‍ය ප්‍රගතිය ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය නියමිත ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කල යුතු වීම |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ එයට අයත් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සහ නායකත්වය සංවර්ධන මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 10 ක් තෘතිය මට්ටමේ පුරප්පාඩු 35 ක්ද, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 77 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 85 ක් ඇතුළු මුළු පුරප්පාඩු සංඛ්‍යාව 207 ක් පැවතුණි. එම පුරප්පාඩු තුළ අමාත්‍යාංශයේ කාර්ය සාධනය කෙරෙහි බෙහෙවින් වැදගත්වන ප්‍රධාන මූල්‍ය නිලධාරි, ඉංජිනේරු හා අභ්‍යන්තර විගණක එක් තනතුර බැගින්ද අධ්‍යක්ෂ තනතුරු 04 ක් කළමනාකරණ සේවා නිලධාරීන් 50 ක් සහ රියදුරු 19 ක් ඇතුළු සේවක ඌනතාවයන් පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කරන ලෙස අදාළ ආයතන වෙතින් ඉල්ලීම් කර ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කල යුතු වීම. |